

2022

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

உணவு ஆணையாளர் திணைக்களம்

FOOD COMMISSIONER'S DEPARTMENT

කාර්ය සාධන වාර්තාව

செயற்திறன் அறிக்கை

Performance Report

කාර්ය සාධන වාර්තාව 2022

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

පටුන

1.	ආයතනික පැතිකඩ	03-09
2.	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	10
3.	මූල්‍ය කාර්යසාධනය	11-20
4.	කාර්යසාධන දර්ශක	21
5.	තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය	22
6.	මානව සම්පත් පැතිකඩ	23-24
7.	අනුකූලතා වාර්තාව	25-33

(01) ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය යටතේ පවතින ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දැක්ම වන්නේ ‘‘ආරක්ෂිතව, අඛණ්ඩව, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සෑම නිවසකටම’’ යන්නයි. 1942 දී ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම,ගබඩා කිරීම හා මිළ නියම කිරීම පිළිබඳ බල අධිකාරිය මෙම දෙපාර්තමේන්තුවට පවරා දී තිබුණි. 2006 පෙබරවාරි මස 08 දිනැති අමප/06/0238/218/010 යටතේ වූ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු දේපළ හා උපකරණ ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරියට පැවරීමට තීරණය කර තිබුණි.එසේ වුවද ජාත්‍යන්තර වශයෙන් ඇතිවූ ආහාර අර්බුදයත් එයින් ඇති විය හැකි අනාගත ආහාර සැපයීමේ අවිනිශ්චිතතාවයත් සැලකිල්ලට ගෙන වෙළඳ අලෙවි සංවර්ධන සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2008 අගෝස්තු මස 11 දිනැති ටීඑම්එම්සී/2008/18 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා කර තිබූ අතර එය 2008 අගෝස්තු මස 27 දිනැති අමප/08/1481/342/016 හා 2008.08.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමත කර තිබුණි.මෙහිදී ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු වත්කම් හා වගකීම් ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරියට පැවරීමට ගනු ලැබූ තීරණය අවලංගු කිරීමත් ,දෙපාර්තමේන්තුව සතු ශ්‍රාවස්තිපුර ,පොළොන්නරුව,අම්පාර ,වේයන්ගොඩ,නාරාහේන්පිට,ඔරුගොඩවත්ත සහ රත්මලාන යන ආහාර ගබඩා සංකීර්ණ හැර අනෙකුත් ගබඩා සහ එම ගබඩා සතු වෙනත් නිශ්චල දේපළ පාලනය කිරීම නැවත තීරණය කරන තුරු දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පැවරීමටත් ,සීමිත කාර්ය මණ්ඩලයක් සහිතව ආහාර සුරක්ෂිතතාවය අරමුණු කර ගනිමින් වසරකට සහල් මෙට්‍රික්ටොන් 100,000 ක් ගබඩාකර තබා ගැනීම සඳහා ප්‍රතිව්‍යුහගත කරන ලද ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කටයුතු නැවත ඇරඹීමටත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත 2022 වසර සඳහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 88.4 ක් ද ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් මිලියන 273.6 ක් ද වෙන්කර තිබුණි.

2020 වසර මුල් භාගයේදී ඇරඹී කොවිඩ් 19 වසංගත තත්ත්වයේ බලපෑම 2022 වසරේදීද පැවති අතරම රට තුළ හටගත් ආර්ථික දුෂ්කරතාවලින් බලපෑමට පත් පවුල් වෙත ලබා දීම සඳහා විදේශයන් මගින් ලැබුණු සහනාධාර ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාරගෙන වරායෙන් නිශ්කාෂණය කර බෙදාහැරීමේ කටයුතුද ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.ඒ අනුව ඉන්දියාව ,චීනය,මැලේසියාව,මියන්මාරය , තායිලන්තය සහ තායිවානය යන රටවලින් ලැබුණු සහල් ,කිරිපිටි,ඖෂධ ඇතුලු සහනාධාර ද්‍රව්‍ය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාරගෙන වරායෙන් නිෂ්කාශණය කර නියමිත පරිදි බෙදා හැරීමේ කටයුතු සිදු කරන ලදී.තව ද ලෝක ආහාර වැඩසටහන යටතේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ලැබුණු සහනාධාර බෙදාහැරීමේ කටයුතු ද 2022 වසරේදී සිදු කරන ලදී.

එමෙන්ම, දෙපාර්තමේන්තුව සතු ගබඩා විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත කුලියට ලබා දී ඇති අතර 2022 වසරේදී රුපියල් මිලියන 189 ක් රාජ්‍ය ආදායමට බැර කිරීමට හැකි විය . දෙපාර්තමේන්තුවට අයත් ත්‍රිකුණාමල ධාන්‍යාගම නිවාස සංකීර්ණයෙහි පිහිටි නිවාස, ත්‍රිකුණාමල ප්‍රදේශයේ නිවාස නොමැති රාජ්‍ය සේවකයන් හා ප්‍රීමා සමාගමේ සේවකයන් සඳහා සහනදායී කුලී පදනම යටතේ ලබා දී ඇති අතර එමඟින් රුපියල් මිලියන 6 ක මුදලක් 2022 වසරේදී රාජ්‍ය ආදායමට බැර කිරීමට හැකි විය. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය 209 ක් වුවත් 2022 වර්ෂයේ සේවය කළ තත්‍ය සේවක මණ්ඩලය 69 කි. එම සේවක මණ්ඩලය උපරිම කාර්යක්ෂමතාවයෙන් කටයුතු කිරීම දෙපාර්තමේන්තුව ලබා ගත් මෙම ප්‍රගතියට ඉවහල් වී ඇති අතර, 2022 වර්ෂය පුරාවටම රට තුල පැවති වසංගත තත්වය නිසා පැන නැගි අයහපත් වාතාවරණය යටතේ වුවද සියලු කටයුතු අඛණ්ඩව හා සාර්ථකව පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

1.2

දැක්ම

"ආරක්ෂිතව,
අඛණ්ඩව,පෝෂ්‍යදායී
ධාන්‍යමය ආහාර
සෑම නිවසකටම"

මෙහෙවර

"ධාන්‍යමය ආහාර ද්‍රව්‍යයන්හි වෙළඳපොළ සුලභතාව,
පාරිභෝගිකයාට ළඟාවීමේ පහසුව සහ පාරිභෝගික මිලදී
ගැනීමේ හැකියාව සුරක්ෂිත කිරීම උදෙසා ආහාර
කොමසාරිස් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පාර්ශව,
දෙපාර්තමේන්තුව සතු වත්කම් සහ කාර්යක්ෂම වුත්,
කැපවුත් සේවක සමූහයා සමඟ මනා ලෙස
සම්බන්ධීකරණය මඟින් ආහාර කොමසාරිස්
දෙපාර්තමේන්තුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම"

අරමුණු

- මහජනතාවට ධාන්‍යමය ආහාර ද්‍රව්‍ය වළෙඳපොල මිලදී ගැනීමට අවශ්‍ය පසුබිම සැකසීම.
- අත්‍යවශ්‍ය අවස්ථාවලදී විදේශ රටවලින් ලැබෙන ආහාර ද්‍රව්‍යමය ආධාර මහජනතාව වෙත බෙදා හැරීමේ කටයුතු සිදු කිරීම.
- රාජ්‍ය අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වලින් සිදුකරනු ලබන වී සහ අනෙකුත් ආහාර ද්‍රව්‍ය වල සැපයුම් ක්‍රියාදාමයන්ට අවශ්‍ය ගබඩා පහසුකම් සැපයීම.

1.3 ප්‍රධාන කාර්යයන්


1. **දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ (SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙ.ටො. 8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.**
   දකුණු ආසියාතික කලාපීය රටවල හදිසි හා ආපදා සහිත අවස්ථාවලදී ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි මෙ.ටො.8000 ක සහල් සංචිතයක් ශ්‍රී ලංකාව විසින් පවත්වාගෙන යා යුතු බව එකී සංවිධානයේ 16 වන සමුළුවේ දී තීරණය කර ඇත.

2. **වෙළඳපොළ සහල් සුලභතාවය පිළිබඳ සහතික වීම.**
   වෙළඳපොළ සහල් හිඟයන් ඇතිවීම තුළින් ඇතිවිය හැකි මිල උච්ඡාවචනයන් අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය අවස්ථාවන්හිදී වෙළඳපොළට තොග මුදා හැරීම සඳහා දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො. 100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීම.

3. **ආයතනය සතු සම්පත් ප්‍රශස්ථ ලෙස කළමනාකරණය කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශ සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කිරීම.**
   දෙපාර්තමේන්තුව සතු ගබඩා ආර්ථික වශයෙන් ඵලදායී ලෙස ලෙස උපයෝජනය කිරීමෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙත රජයේ තක්සේරුවට අනුව කුලී පදනම මත ලබා දීමෙන් රාජ්‍ය ආදායමට දායකත්වය ලබා දීම.

4. **විද්‍යාත්මක ක්‍රම භාවිතා කරමින් ධාන්‍ය ගබඩා කිරීම සඳහා පහසුකම් සැලසීම.**
   ආහාර ද්‍රව්‍යයන්හි ඉහල ගුණාත්මකභාවය පවත්වා ගනිමින් විද්‍යාත්මක ක්‍රමවේදයක් භාවිතා කරමින් ආහාර ගබඩා කර පාරිභෝගිකයාට ඉහළ ප්‍රමිතියකින් යුතු ආහාර ලබා දීම.

1.4 සංවිධාන ව්‍යුහය


ආහාර කොමසාරිස්
නියෝජ්‍ය ආහාර කොමසාරිස්
ප්‍රධාන ගණකාධිකාරී
සහකාර ආහාර කොමසාරිස්
ගණකාධිකාරී
පරිපාලන නිලධාරී
තත්ත්ව පාලන නිලධාරී
වැඩ පරීක්ෂක
ධාන්‍ය සමීක්ෂක
නීති අංශය
සැපයුම් හා සැලසුම් අංශය
තොරතුරු තාක්ෂණ අංශය
ප්‍රවාහන අංශය
පාලන අංශය
තත්ත්ව පාලන අංශය
ගිණුම් අංශය

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- ආයතන අංශය
- ගිණුම් අංශය
- සැලසුම් අංශය
- සැපයුම් අංශය
- නීති අංශය
- තොරතුරු තාක්ෂණ අංශය

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් නගා සිටුවීමේ වැඩසටහන යටතේ රු. මිලියන 376.7 ක මුදලක් 2020 සහ 2021 වර්ෂ වල අයවැය මඟින් ලබා දී තිබුණි. එම මුදල චක්‍රීය අරමුදලක් ලෙස මේ වන විට දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිති සහ විවිධ සේවා සමූපකාර සමිති වෙත වී මිලදී ගැනීමේ කටයුතු සඳහා කාරක ප්‍රාග්ධනය ලෙස භාවිතා කිරීමට ලබා දී ඇත.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතීන්

(අ) ව්‍යාපෘතියේ නම - නැවුම් එළවලු හා පළතුරු ගබඩා කිරීම සඳහා උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ලද මෙට්‍රික් ටොන් 5000 ක ධාරිතාවයෙන් යුතු ගබඩා සංකීර්ණයක් දඹුල්ල ප්‍රදේශයේ ඉදි කිරීම.

(ආ) දායක නියෝජිතායතන - ඉන්දීය රජය සහ ශ්‍රී ලංකා මධ්‍යම රජය

(ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රුපියල් මිලියන 525 (මින් රුපියල් මිලියන 300 ක් ඉන්දීය රජයේ ඍජු ප්‍රදානයක් වන අතර ඉතිරි මුදල ශ්‍රී ලංකා මධ්‍යම රජය මඟින් දරණු ලබයි).

(ඈ) ව්‍යාපෘති කාල සීමාව - 2019 මාර්තු 30 දින වැඩ ආරම්භ කර මාස 06 ක කාල සීමාවක් තුළ අවසන් කිරීමට යෝජිත වූ මෙම ව්‍යාපෘතිය කොවිඩ් 19 හදිසි වසංගත තත්ත්වය නිසා සිදු වූ අනපේක්ෂිත තත්ත්වයන් හා ව්‍යාපෘතිය කරගෙන යාමේදී මතු වූ තාක්ෂණික ගැටලු නිසා මෙතෙක් අවසන් කිරීමට නොහැකි විය. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ඉදිරියේදී කඩිනමින් අවසන් කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය.



ගබඩා සංකීර්ණයෙහි ඉදිකිරීම් කටයුතු අතරතුර



උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ලද ගබඩා සංකීර්ණය ඉදිකිරීමෙන් පසුව දිස්වන අයුරු

(02) පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ජයග්‍රහණ

දෙපාර්තමේන්තුව සතු ගබඩා 53 ක් රාජ්‍ය හා පුද්ගලික අංශ වෙත ලබා දීමෙන් රුපියල් මිලියන 189 ක ආදායමක් සහ ත්‍රිකුණාමල ධාන්‍යාගම නිවාස සංකීර්ණයෙහි පිහිටි නිවාස සහනදායී කුලී පදනම යටතේ ලබා දීමෙන් රුපියල් මිලියන 6 ක මුදලක් 2022 වසරේදී රාජ්‍ය ආදායමට බැර කිරීමට හැකි විය. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගබඩා 2022 වසරේදී රුපියල් මිලියන 11 ක වියදමකින් නවීකරණය කර ඇත.ආර්ථික දුෂ්කරතාවයන් නිසා බලපෑමට ලක් වූ පවුල් සඳහා විදේශවලින් ලැබුණු ආධාර රජය වෙනුවෙන් භාරගෙන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත භාර දීමේ කාර්යය මනා සම්බන්ධීකරණයෙන් යුතුව ඉටු කර ඇත.

අභියෝග

ආරක්ෂිත සහල් තොගයක් පවත්වාගෙන යාමට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 50 ක මුදලක් වෙන් කර තිබුණද, මෙට්‍රික් ටොන් 8,000 ක සංචිතයක් පවත්වා ගැනීමට මෙම මුදල ප්‍රමාණවත් නොවූ බැවින් එම ප්‍රතිපාදන රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙත මාරුකර ඇත.

ඉදිරි ඉලක්ක

නැවුම් එළවලු හා පළතුරු ගබඩා කිරීම සඳහා උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ලද දඹුල්ල ප්‍රදේශයේ ඉදිකෙරෙමින් පවතින මෙට්‍රික් ටොන් 5,000 ක ධාරිතාවයෙන් යුතු ගබඩා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඉදිරියේදී නියමිත පරිදි නිම කර එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කර ජනතාව වෙත පවරා දීමට යෝජිතය. තවද දෙපාර්තමේන්තුව සතු වත්කම් ආර්ථික වශයෙන් ඵලදායී ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇති අතර ඒ අනුව ගබඩා නවීකරණය කිරීම හා දැනට උපයෝජනය කර නොමැති ගබඩා සහ ඉඩම් පෞද්ගලික අංශය සමඟ ද සම්බන්ධීකරණයෙන් රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමට අපේක්ෂිතය.

ඩී.ඩී.උපුල් ශාන්ත ද අල්විස්
ආහාර කොමසාරිස්
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

(03) මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	- 2021 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		324,898,000	148,085,000.00	ඒසිඒ-3
-	තැන්පතු		30,102,353	84,050,043.00	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		6,056,772	7,956,354.00	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**361,057,125**	240,091,397.00	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**361,057,125**	**240,091,397.00**	

	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		4,401,326	10,941,854.00	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		356,655,799	229,149,543.00	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		**-**	-	
35,600,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	46,476,971	42,776,645.00	
52,300,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	37,681,349	31,208,742.00	**ඒසිඒ-2(ii)**
500,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	454,694.00	398,308.00	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
	VAT		1,116,000		
88,400,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**85,729,014**	74,383,695.00	
	මූලධන වියදම්				
14,500,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	13,606,103	164,694,043.00	
248,500,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	2,235,331	682,120.00	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
600,000.00	හැකියා වර්ධනය	**14**	387,250	-	
10,000,000.00	වෙනත් මූලධන වියදම්	**15**	-	299,794,470.00	

273,600,000.00	**මුළු මූලධන වියදම් (උ)**	**16,228,684**	465,170,633.00	
	තැන්පතු ගෙවීම්	23,471,605	78,422,984.00	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්	4,695,231	3,996,000.00	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්	-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)	28,166,836	82,418,984.00	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)	130,124,534	621,973,312.00	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**	226,531,266	(392,823,769.00)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය	226,531,266	(392,823,769.00)	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය	-	-	**ඒසිඒ-3**

ඒසිඒ-7

අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

වෙනත් ආයතන විසින්, **වාර්තාකරණ ආයතනය** වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් **වාර්තාකරණ ආයතනය** විසින් දරන ලද වියදම්	449,985,744.00	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම්	1,688,480.00	
අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම්	29,119.00	**451,703,343.00**
අඩු කළා :		
අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්, **වාර්තාකරණ ආයතනය** විසින් එකතු කරන ලද ආදායම්	210,027,474.00	
වෙනත් ආයතන විසින්, **වාර්තාකරණ ආයතනය** වෙනුවෙන් දරන ලද වියදම්	14,245,775.00	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම්	895078	
අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම්	3750	**225,172,077.00**
2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**226,531,266.00**

*** ඉහත සඳහන් අයිතමවලට අමතරව අදාළ වන අයිතමයන් ගැලපීම් කළ හැක.**

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-8

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	5,002,876,021.00	4,911,893,190.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	12,717,845.00	14,079,386.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	2,681,919.00	10,941,854.00
VAT පාලන		402,886.00	
මුළු වත්කම්		**5,018,678,671.00**	**4,936,914,430.00**
ඉද්ධ වත්කම් / ශ්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		(96,974,412.00)	(89,385,008.00)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		4,913,756,745.00	4,911,893,190.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	89,119,276.00	
ප්‍රාග්ම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	110,095,143.00	103,464,394.00
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	2,681,919.00	10,941,854.00
මුළු වගකීම්		**5,018,678,671.00**	**4,936,914,430.00**

පිටු අංක 9 සිට 31 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..32.. සිට ..43.. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	දිනය : 2023 02 24
තනතුර :	තනතුර :	
දිනය : 2023/02/28	දිනය : 27.02.2023	

ජී.සී.එන්. ෆොන්සේකා
ප්‍රධාන ගණකාධිකාරි
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
අංක. 330, ගුනියන් පෙදෙස,
කොළඹ 02.

ඒ.එම්.පී.එම්.බී. අතපත්තු
ලේකම්
වෛද්‍ය, වාණිජ හා
ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

එම. රසුල් ෆෛරූස් ද අල්විස්
අතිරේක ලේකම්
(සෞඛ්‍ය සේවයන්) අමාත්‍යාංශය
අංක. 330, ගුනියන් පෙදෙස,
කොළඹ 02.

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022	**2021**
	රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	210,027,474	184,492,238
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	324,898,000.00	148,085,000
අත්තිකාරම් අයකර ගැනීම්	5,263,370	6,998,734
වෙනත් ප්‍රධාන ලෙජර්		2,111,837
තැන්පතු ලැබීම්	30,102,353	84,050,043
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**570,291,197**	**425,737,852**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	83,935,017	317,221,062
සහනාධාර සහ මාරුකිරීම්	454,694	398,308
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	449,985,744	8,738,379
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	4,401,326	10,941,854
අත්තිකාරම් ගෙවීම්	4,691,481	3,996,000
වෙනත් ප්‍රධාන ලෙජර්		5,337,145
VAT	1,115,999	
තැන්පතු ගෙවීම්	23,471,605	78,422,984
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**568,055,866**	**425,055,732**

මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,235,331**	**682,120**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	2,235,331	682,120
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,235,331**	**682,120**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(2,235,331)**	**(682,120)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

නොමැත

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.01.01	ගබඩා කුලී (s)	148,919	171,683.476	189,354.271	110.29%
	නිවාස කුලී	6908	6138.671	6,423.868	104.6%

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	88,400	88,400	85,729	96.97 %
ප්‍රාග්ධන	273,000	273,000	16,228	5.94 %

3.8 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	සෞඛ්‍ය අමාත්‍යාංශය	වේයන්ගොඩ ගබඩාවේ හිඟ ගබඩා කුලී නිරවුල් කිරීම	1,600	4,800	4,800	100.00 %
02	වෙළඳ ,වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය	විදේශ ආධාර ලෙස ලැබුණ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වරායේ සිට නිශ්කාශනය කර ගබඩා වෙත ප්‍රවාහනය කිරීම ,ගබඩා කිරීම,නැවත ප්‍රවාහනය	100,000	429,246	342,301	79.80 %
03	ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව	විදේශ ආධාර ලෙස ලැබුණ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වරායේ සිට නිශ්කාශනය කර ගබඩා වෙත ප්‍රවාහනය කිරීම ,ගබඩා කිරීම,නැවත ප්‍රවාහනය	3,582	87,879	82,317	93.70 %
04	අධ්‍යාපන අමාත්‍යාංශය	චීන රජයේ සහනාධාර ලෙස ලැබුණු සහල් වරායේ සිට නිශ්කාශනය කර ගබඩා වෙත ප්‍රවාහනය කිරීම	11,828	25,000	19,724	78.90 %
05	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම වැටුප් ගෙවීම	-	-	1,024	-

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2022** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2022** දිනට මූල්‍ය තත්වය වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	6,978,604	6,978,604	-	100 %
9152	යන්ත්‍රෝපකරණ	65,613	65,613	-	100 %
9153	ඉඩම්	2,780,751	2,780,751	-	100 %
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	100 %
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	100 %
9160	කෙරීගෙන යන වැඩ	177,900	177,900	-	100 %
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	100 %

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

පිටු අංක 34 සිට 47 දක්වා

(04) පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස (%) තත්‍ය නිමැවුම		
	100 %-90%	**75%-89%**	**50%-74%**
මෙ.ටො. 100,000 ක ආරක්ෂිත සහල් සංචිතය	-	-	(50%) ආරක්ෂිත සහල් සංචිත පවත්වා ගැනීමට අවශ්‍ය ගබඩා පහසුකම් වැඩි දියුණු කරන ලදී.
වෙළඳපොළ සහල් සුලභතාවය	-	-	(60%) සුලු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ගේ සහල් නිෂ්පාදනය කිරීමේ වැඩසටහන අධීක්ෂණය කිරීම මඟින් වෙළඳපොල තුළ සහල් සුලභතාවය පවත්වා ගැනීමට දායක විය.
ආයතනයේ සම්පත් මනා කළමනාකරණය සඳහා අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණ කටයුතු	(95%) ගබඩාවන් සහ නිවාස කුළියට ලබා දීමෙන් රාජ්‍ය ආදායමට දායකත්වයක් දැක්වීම	-	-

(05) පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50-74	75-100
කුසගින්න අවසන් කිරීම (Zero Hunger)	*ආහාර මිළ උච්ඡාවචනය වැළැක්වීම *ආහාර සංචිත පවත්වා ගැනීම	*එළවලු සහ පළතුරු ගබඩා කිරීමට උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ලද ශීතාගාර සංකීර්ණයක් ඉදිකිරීම ඇරඹීම. *සහල් ආරක්ෂිත සංචිත පවත්වා ගැනීම සඳහා විද්‍යාත්මක ගබඩාවන් ඉදි කිරීම			✓ ✓

5.2 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන අරමුණ වනුයේ කුසගින්න අවසන් කරන්න (Zero Hunger) යි.

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශයට අදාළව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පාරිභෝගික ආහාර ද්‍රව්‍යය වන සහල් ගබඩාගත කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට ආහාර දෙපාර්තමේන්තුව බැඳී සිටී.ඒ අනුව නිෂ්පාදනය සහ සැපයීම අවප්‍රමාණය වූ කාල සීමාවන් තුල දී ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ගබඩා පහසුකම් සැපයීමේ අරමුණින් දෙපාර්තමේන්තුව සතු ගබඩාවන් ආහාර ගබඩා කිරීමට සුදුසු පරිදි අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.

තවද තිරසර කෘෂිකර්මාන්තය නඟාසිටුවීමේ අරමුණින් සහ පසු අස්වනු හානි අවම කිරීමේ අරමුණින් යුක්තව එළවලු සහ පළතුරු ගබඩාගත කිරීම සඳහා උෂ්ණත්වය සහ සාපේක්ෂ ආර්ද්‍රතාවය පාලනය කරන ලද ගබඩා සංකීර්ණයක් දඹුල්ල ප්‍රදේශයේ ඉදිකිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

වසර 2030 වන විට ජාතික දරිද්‍රතාවේ රේඛාවෙන් පහල ජීවත්වන ජනගහනයේ අනුපාතය අඩකින් අඩු කිරීමට දායක වීමේ අරමුණින් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ තිරසර සංවර්ධන අරමුණ සකස් වී ඇත.

(06) මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	06	02	04	–
තෘතීයික	03	01	02	–
ද්විතියික	109	37	72	–
ප්‍රාථමික	91	29	62	04

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබා ඇති ආකාරය

දෙපාර්තමේන්තුව තුළ අනුමත සේවක සංඛ්‍යාව රාජකාරිවල නිරත වේ නම් වඩා කාර්යක්ෂම සහ ඵලදායී ලෙස රාජකාරි කටයුතු සිදු කිරීමේ හැකියාවක් පවතී.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රුපියල්)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
ප්‍රසම්පාදන වාර්තා සහ ටෙන්ඩර් ක්‍රියාවලිය	1	දින 03	18,000.00	-	දේශීය	ප්‍රසම්පාදන වාර්තා සහ ටෙන්ඩර් ක්‍රියාවලිය පිලිබඳ දැනුම
කාර්යාල ක්‍රම සහ ආයතන සංග්‍රහය	3	දින 03	54,000.00	-	දේශීය	කාර්යාල ක්‍රම සහ ආයතන සංග්‍රහය පිලිබඳ දැනුම
MS Excel Skills	4	දින 03	52,000.00	-	දේශීය	MS Excel සංග්‍රහය පිලිබඳ දැනුම

වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රුපියල්)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
ලංසු ඇගයීම සහ පොදු ප්‍රසම්පාදනය	1	දින 03	18,000.00	-	දේශීය	ලංසු ඇගයීම සහ පොදු ප්‍රසම්පාදනය පිලිබඳ දැනුම
කාර්යක්ෂම ආහාර ගබඩා ක්‍රමවේදයන් සහ කළමනාකරණ ක්‍රම	1	දින 03	නොමිලේ පවත්වනු ලැබූ දේශීය වැඩසටහනකි			
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ,සැලසුම් සහ නියාමනය	4	දින 03	72,000.00	-	දේශීය	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ,සැලසුම් සහ නියාමනය පිලිබඳ දැනුම
දෙමල භාෂා සහතික පත්‍ර පාඨමාලාව	17	පැය 150	56,250.00	-	දේශීය	රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය
රියැදුරන් සහ සුලු සේවකයන් සඳහා ආචාර ධර්ම සහ විනය	2	දින 02	17,000.00	-	දේශීය	ආචාර ධර්ම සහ විනය පිලිබඳ දැනුම
ප්‍රසම්පාදන කළමනාකරණය සහ ගිවිසුම් පරිපාලනය	1	මාර්ගගත	100,000	-	දේශීය	ප්‍රසම්පාදන කළමනාකරණය පිලිබඳ දැනුම

(07) අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01 . පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ				
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වානිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ	වර්තමානයේ දෙපාර්තමේන්තුවේ මෙම අත්තිකාරම් ගිණුම් ක්‍රියාත්මක නොවේ.	ඉදිරියේදී ප්‍රමිතීන් හෝ චක්‍රලේඛ අනුව මෙම අත්තිකාරම් ගිණුම් මෙම දෙපාර්තමේන්තුවට අදාළ වුවහොත් අනුකූල පරිදි සකස් කිරීමට කටයුතු කිරීම
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.6	වෙනත්	අනුකූල නොවේ		
02 . පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)				
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති වීම	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති බැවින් නිසි පරිදි තනතුරක් ඇති කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03 . මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම(මු.රෙ 135)				
3.1	මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා දී තබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රෙල්ඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04 .වාර්ෂික සැලසුම් සකස් කිරීම				
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති වීම	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති බැවින් නිසි පරිදි තනතුරක් ඇති කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05 . විගණන විමසුම්				
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6 . අභ්‍යන්තර විගණනය				
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසරේ ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති වීම	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති බැවින් නිසි පරිදි තනතුරක් ඇති කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදි පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ		

6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව , සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති වීම	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණකවරයෙක් නොමැති බැවින් නිසි පරිදි තනතුරක් ඇති කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
07 . විගණන හා කළමනාකරණ කමිටු				
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08 . වත්කම් කළමනාකරණය				
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිළදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත්කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම ආරම්භ කර ඇත.	අපහරණ කටයුතු ඉදිරියේදි නියමිත කාලය තුළ සිදු කිරීම
09 . වාහන කළමනාකරණය				
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කිරීම	අනුකූල නොවේ	ගර්හිත වාහන අපහරණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත	අපහරණ කටයුතු ඉදිරියේදි නියමිත කාලය තුළ සිදු කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදුවාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10 . බැංකු ගිණුම් කළමණාකරණය				
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළතනිරවුල් කර තිබීම	අනුකූල වේ		
11 . ප්‍රතිපාදන උපයෝජනය				
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12 . රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්				
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13 .පොදු තැන්පත් ගිණුම				
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14 . අග්‍රිම ගිණුම				
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම	අනුකූල වේ		

	එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම			
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15 . ආදායම් ගිණුම				
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදයමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16 . මානව සම්පත් කළමනාකරණය				
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17 . මහජනයා වෙත තොරතුරු ලබා දීම				
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවියක් හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය	අනුකූල වේ		

	පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම			
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18 . පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම				
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19 . මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම				
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ක ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත්			

	සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20 . විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම				
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීඒසි/සී/එෆ්ඩී/එෆ්ඒ/2022 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 31 දින

ආහාර කොමසාරිස්,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

(අ) අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් රු.1,688,480 ක් වුවද එය අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරන ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් ලෙස දක්වා තිබුණි. තවද අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් “බී” ගිණුමට කරන ලද බැර කිරීම් 29,119 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) වෙනත් ආයතන විසින් වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද වියදම් රු.14,216,655 ක් වුවද එය රු.14,245,775 ක් ලෙස රු.29,119 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය වත්කම්

(i) 2022 දෙසැම්බර් 13 දිනැති අංක 05/2022 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.9 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාල සීමාව අවසානයේ වාර්තාකරණ ආයතනය විසින් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද රු.2,681,919 ක මුදල් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දෑ හි ශේෂයට ඇතුලත් නොකල යුතු වුවත් එම වටිනාකම ඇතුලත් කර තිබුණි.

(ii) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ රු.402,886 ක VAT පාලන නමින් ශේෂයක් පෙන්නුම් කර තිබුණි.

1.6.3 ශුද්ධ වත්කම් /ස්කන්ධය

රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.8 ඡේදය ප්‍රකාරව අත්තිකාරම් ගිණුම්වල වටිනාකම්වින් තැන්පතු ගිණුම්වල වටිනාකම අඩු කිරීමෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ ඇති භාණ්ඩාගාරයට ශුද්ධ වත්කම් අගය ගණනය කළ යුතු වුවත් එසේ ක්‍රියාකර නොතිබුණි.

1.6.4 දේපල පිරියත හා උපකරණ සංචිතය

2022 දෙසැම්බර් 13 දිනැති අංක 05/2022 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.7 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණවල අගයට සමාන වටිනාකමක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ සංචිතයක් ලෙස දැක්විය යුතු වුවද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි (ඒසීඒ-පී හි) රු 89,119,276ක් වූ කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම්

අත්තිකාරම් ගිණුම් යටතේ දැක්විය යුතු වුව ද දේපළ පිරියත හා උපකරණ යටතේ එකතු කර දැක්වීම හේතුවෙන් ඒ හා සමාන ප්‍රමාණයෙන් දේපළ පිරියත හා උපකරණ සහ දේපළ පිරියත හා උපකරණ සංචිත ගිණුම් ශේෂයන් වෙනස් වී තිබුණි.

1.6.5 තැන්පතු ගිණුම් ශේෂ

6000-0-0-016-0-120 දරන තැන්පතු ගිණුමේ ආරම්භක ශේෂය දෙපාර්තමේන්තු පොත් අනුව රු.16,574,196 ක් වුවත් ACA 4 ආකෘතියේ එය රු.1,657,419 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව තැන්පතු ගිණුම්වල ආරම්භක ශේෂ එකතුව රු.103,464,394 ක් වුවද ACA 4 ආකෘතියේ එය රු.88,547,618 ක් ලෙස රු.14,916,776 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.6 අත්තිකාරම් ගිණුම් ශේෂ

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව ආරම්භක හා අවසාන ශේෂ භාණ්ඩාගාර පොත් අනුව ආරම්භක හා අවසාන ශේෂයෙන් රු.332,250 කින් වෙනස් වී තිබුණු අතර කාලයක සිට පැවත එන මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට 2022 දෙසැම්බර් 31 වන විට ද ක්‍රියාකර නොතිබුණි.

1.6.7 අග්‍රිම ශේෂය

දෙපාර්තමේන්තු පොත් අනුව අග්‍රිම ශේෂයක් නොතිබුණ ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.2,681,919 ක් ඇතුලත් කර තිබුණි.

1.6.8 විගණනය සඳහා සාක්ෂි නොවීම

අයවැය ඇස්තමේන්තුව මඟින් 1701 වැය විෂය සඳහා ප්‍රතිපාදන සලසාගෙන නොතිබු අතර මුදල් රෙගුලාසි 66 මාරු කිරීම මඟින් එම වැය විෂයය වෙත රු.4,150,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි.මෙම වැය විෂයයෙන් පාඩු සහ කපා හැරීම යටතේ රු.4,129,525 ක් පොත් වලින් කපා හැර තිබුණ ද ඒ පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි

1.6.9 ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීම

අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුම ඇවර කිරීමේදී ඇති වූ අතිරික්තය හේතුවෙන් මහා භාණ්ඩාගාරයට වැඩිපුර පියවීම නිසා ඇති වූ ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීම සඳහා විවිධ ආදායම් ගිණුමට බැර කල අතිරික්තය වූ රු.1,719,407 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ භාණ්ඩාගාර අත්තිකාරම් ලෙස දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) 2021 ජූලි 28 දිනැති අංක 01/2021 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.2 (අ) ඡේදය මඟින් 2021 ජූලි 01 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව පදනම් කරගෙන 2022 වසර සඳහා වැටුප් වේතන සහ වෙනත් දීමනා එක් එක් අය වෙනුවෙන් වෙන් වෙන්ව ගණනය කළ යුතු බවටත් 2022 වර්ෂය තුල

නව බඳවා ගැනීම් අධෛර්යමත් කරන බැවින් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් නොකරන බවත් දන්වා තිබියදී, ඒ අනුව ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන්,

- වැටුප් හා වේතන 1001 වැය විෂයෙන් රු.3,000,000 ක් එනම් සියයට 9 ක් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයන් වෙත මාරු කර තිබූ අතර එම මාරු කිරීම් සිදු කිරීමෙන් අනතුරුව වියදම් දැරීමෙන් පසුව ද රු.1,484,341 ක් එනම් සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 5 ක් ඉතිරි වී තිබුණි.

- වෙනත් දීමනා 1003 වැය විෂයෙන් රු.1,100,000 ක් එනම් සියයට 6.9 ක් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබූ අතර එම මාරු කිරීම් සිදු කිරීමෙන් අනතුරුව වියදම් දැරීමෙන් පසුව ද රු.485,905 ක් එනම් සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 3.26 ක් ඉතිරි වී තිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 13 දිනැති 05/2022 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.4 ඡේදය ප්‍රකාරව වැය විෂයයක මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර වෙනස එම වැය විෂයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 හෝ රු.10,000 යන දෙකෙන් කවර හෝ වැඩි මුදලකට වැඩි වන්නේ නම් වෙනසට හේතු ඉදිරිපත් කළ යුතු වුවත් වැය විෂයයන් 09 කට අදාලව වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 06 ක් සම්බන්ධයෙන් ඉතිරිය ඉක්මවා රු.4,122,969 ක බැඳීම් ඇති කරගෙන තිබුණි.

(ආ) බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් වූ රු.99,800 ක් වූ බැරකම් 2 ක් 2023 මාර්තු 30 දින විටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන අයවැය චක්‍රලේඛයේ xii ඡේදය ප්‍රකාරව සියලුම සුභසාධන හා සහනාධාර වැඩසටහන් නැවත සමාලෝචනය කර ඒවා අත්‍යවශ්‍යයන්ම ලැබිය යුතු අඩු ආදායම්ලාභීන්ට හෝ අත්‍යවශ්‍ය ප්‍රතිලාභීන්ට පමණක් ලබාදීම සිදු කල යුතු බව දක්වා තිබුණෙන් ඒ පිළිබඳ අවධානය යොමු කර සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් නහා සිටුවිමේ වැඩසටහන යටතේ ප්‍රතිපාදිත රු.50,000,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. එසේ වුවද 300-1-1-4-2506 වැය විෂයට යටතේ බස්නාහිර පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත රු.30,000,000 ක බැරකමක් දක්වා තිබුණු අතර 2022 වර්ෂයේ ඒ සම්බන්ධ ගිවිසුමකට එළඹීම හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියාකර නොතිබිය දී 2023 පෙබරවාරි මාසයේදී රු.20,000,000 ක් පමණක් ගෙවා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් පිළිබඳ ප්‍රකාශය (i) (ඇමුණුම iv)තුල මුදල් රෙගුලාසි 94(2) සහ (3) ප්‍රකාරව බැරකම් වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශයෙහි රු.216,039 ක බැඳීමක් පමණක් ඇතුලත් විය යුතු වුවද ඇමුණුම (iii) හි ඇතුලත් රු.4,469,507 ක බැරකම් ද ඇතුලත් කිරීම හේතුවෙන් මු.රෙ 94 (2) සහ (3) ප්‍රකාරව බැරකම් වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශයේ රු.4,253,468 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ඉන්දියන් ආධාර බෙදා හැරීම හා ලෝක ආහාර වැඩසටහනේ වියදම් වෙනත් වැය ශීර්ෂ වන වෙළඳ අමාත්‍යාංශය හා ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ සිදුකර තිබුණ ද බැඳීම් හා බැරකම් යටතේ එම වැඩසටහන් වලට අදාළ රු.173,883 අතිකාල හා නිවාඩු දින වැටුප් 300-1-1-0-1002 දරන ආහාර දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ ගෙවා තිබුණි.

2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සම්බන්ධීකරණය යටතේ මානුෂීය ආධාර ලෙස ශ්‍රී ලංකාවට පිරිනමනු ලබන සහල් මෙට්‍රික් ටොන් 40,000 ක්, කිරිපිටි මෙට්‍රික් ටොන් 500 ක් හා ඖෂධ මෙට්‍රික් ටොන් 50 ක් ලබාදීමේ වැඩසටහන අදියර 03 ක් යටතේ ක්‍රියාත්මක කර තිබුණි. මෙම අදියර තුනේදී වරායෙන් භාණ්ඩ නිදහස් කර ගැනීමේ සිට අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ආහාර ද්‍රව්‍ය බෙදාහැරීමේ කාර්යය ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් සිදුකර තිබුණි.මෙහිදී පලමු අදියර සඳහා සහල් මෙට්‍රික් ටොන් 9,000 ක් හා කිරිපිටි මෙට්‍රික් ටොන් 50 ක් ද දෙවන අදියර සඳහා සහල් මෙට්‍රික් ටොන් 14,643.95 ක් හා කිරිපිටි මෙට්‍රික් ටොන් 250 ක් ද, තුන්වන අදියර සඳහා සහල් මෙට්‍රික් ටොන් 16,356.05 ක් හා කිරිපිටි මෙට්‍රික් ටොන් 200 ක් වශයෙන් ලබා දී තිබුණි. මෙම ආධාර බෙදා හැරීමට වැය දැරීම සඳහා වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයෙන් රු.481,340,167 ක ප්‍රතිපාදනයක් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිෂ්කාශන ආයතනයක් තෝරා ගැනීම

(i) පළමු අදියර යටතේ ලද සහනාධාර නිෂ්කාශනය සඳහා මිල ගණන් කැඳවීම 2022 මැයි 17 දින සිදුකර තිබුණු අතර පහත කරුණු නිරීක්ෂණය විය.

- 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය ප්‍රකාරව විද්‍යුත් තැපැල් මඟින් මිල ගණන් විමසිමේදී දින 05 ක කාලයක් ලබාදිය යුතු වුවද මිල ගණන් ඉදිරිපත් කිරීමට දිනක කාලයක් පමණක් ලබා දී තිබුණි.ආයතන 03 කින් ඉදිරිපත් කල මිල ගණන් අනුව එක් පෞද්ගලික සමාගමක් තෝරාගෙන තිබුණු අතර මිල ගණන් ඉදිරිපත් කල බවට ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- එසේ වුවද විෂය පථයේ වෙනස්වීම් මත 2022 මැයි 19 දින නැවත වරක් ආයතන 07 කින් විද්‍යුත් තැපැල් මඟින් මිල ගණන් විමසා තිබුණු අතර කලින් තෝරාගත් පෞද්ගලික සමාගම පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.විෂය පථයේ වෙනස් වීම් මත නැවත මිල ගණන් කැඳවුවද එම වෙනස්වීම් මොනවාද යන්න විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii)ආධාර ලැබීමේ දෙවන හා තුන්වන අදියර සඳහා ලද ආධාර නිෂ්කාශන කටයුතු සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මඟින් 2022 ජූනි 08 දින නැවතත් මිල ගණන් කැඳවීමක් කර තිබුණි. ඒ අනුව ආයතන 02 ක් විසින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර එම අවස්ථාවේදී ද ඉහත සමාගමම තෝරාගෙන තිබුණු අතර අඩුම මිල ඉදිරිපත් කල ආයතනය විස්තරාත්මක ඇගයීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා නොමැති බව සඳහන් කරමින් තාක්ෂණික ඇගයීම් කමිටුව එම මිල ගණන් ප්‍රතික්ෂේප කර තිබුණි.

(ආ) බෙදාහැරීමේ සැලැස්ම

බෙදාහැරීමට නියමිත බවට තහවුරු කල ප්‍රමාණය හා බෙදාහැරීමට සැලසුම් කල ප්‍රමාණය අතර වෙනස්කම් පැවතුණ බව නිරීක්ෂණය විය.ඒ අනුව පළමු අදියරයේදී සහල් කිලෝග්‍රෑම්

7,250 ක් හා කිරිපිටි කිලෝග්‍රෑම් 450 ක් ද, දෙවන අදියරයේදී සහල් කිලෝග්‍රෑම් 33,950 ක් හා කිරිපිටි කිලෝග්‍රෑම් 600 ක්ද, තුන්වන අදියරයේදී සහල් කිලෝග්‍රෑම් 256,050 ක් හා කිරිපිටි කිලෝග්‍රෑම් 1,245 ක ප්‍රමාණයක්ද බෙදාහැරීමේ සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) සහනාධාර තොග ගබඩා කිරීම හා ගබඩා කුලියට ගැනීම

(i) ඉන්දියානු සහනාධාර ගබඩා කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තු කොළඹ බඩු ගබඩා සංකීර්ණයේ පිහිටි C2 – F4 ගබඩාව වැට සහිත මාසික බදු කුලිය රු.517,440 කට 2022 මැයි 23 දින සිට 2023 මැයි 22 දින දක්වා වර්ෂයක කාලයක් සඳහා බදුගෙන තිබුණු අතර ආපසු ගෙවනු ලබන රු.2,993,760 ක ඇප තැන්පතුවක් ද තබා තිබුණු අතර අත්‍යවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් තිබේ ද යන්න සලකා බැලීමකින් තොරව බදු ගැනීම නිසා එම අවශ්‍යතාවය සඳහා අතිරේකව රු.278,025 ක මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

(ii) ඉහත ගබඩාවට අමතරව 2022 ජූලි 29 දින සිට ඉන්දිය සහනාධාර ගබඩා කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව සතු C2 – C ගබඩාව ද කුලියට ලබාගෙන තිබුණු අතර වැට සහිත මාසික බදු මුදල රු.206,976 ක් හා ඇප තැන්පතු මුදල රු.413,952 ක් ගෙවා තිබුණු අතර බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

(iii) ඉන්දියානු ආධාර බෙදාහැරීම භෞතික පරීක්ෂාවට ලක්කල දිනයේ මරදාන දුම්රිය ගබඩා දෙකෙහිම විශාල ඉඩ ප්‍රමාණයක් ඉතිරිව තිබුණ ද දුම්රියේ ප්‍රවාහනය කිරීමට සැලසුම් කල සහල් තොග මරදාන ගබඩාවේ රඳවා නොගෙන ඔරුගොඩවත්ත ගබඩාවේ ගබඩා කිරීම නිසා නැවතත් මරදාන ගබඩාවට ප්‍රවාහනය කිරීම වෙනුවෙන් 2022 ජූලි 04 දින සිට ජූලි 18 දින දක්වා කාලය තුල රු.1,631,700 ක අතිරේක ප්‍රවාහන වියදමක් දරා තිබුණි.

(iv) සහල් ඇසුරුම් කැඩියාම නිසා ඔරුගොඩවත්ත හා මරදාන ගබඩාවල දෛනිකව එකතු කරන ලද සහල් ද නැවත පිරිසිදු කර ඇසුරුම් කර බෙදාහරින බව සඳහන් වුවද ඒ පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර කැඩුණු සහල් මලු සැකසීම,දුම්රිය ගබඩා පිරිසිදු කිරීම ආදි කටයුතු වෙනුවෙන් 2022 ජූනි 14 සිට 2022 ජූලි 16 දක්වා කාලය තුල රු.101,320 ක වියදමක් ද ඇමදුම් සහල් එකතු කිරීම වෙනුවෙන් කවර මිල දී ගැනීම සඳහා 2022 ජූනි 03 සිට 2022 සැප්තැම්බර් 12 දක්වා කාලය තුල රු.787,520 ක වියදමක් ද දරා තිබුණි.

(v) සහල් මලු රැගෙන යන කම්කරුවන් වැගන් එකට ගොඩවීම සඳහා ආධාරක ලෙස බිමට සහල් මලු භාවිතා කර තිබුණු අතර ඒ මතින් ඇවිදියාම නිසා සහල් තවදුරටත් අපතේ යාමක් සිදු වී තිබුණු අතර එය වලක්වා ගැනීමට ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) තොග හානි වීම් හා ඌණතා

(i) අදියර I,II හා III යටතේ නෞභාරපත අනුව ලද සහල් ප්‍රමාණය කිලෝග්‍රෑම් 40,000,000 ක් වුවද වරායෙන් නිදහස් කරගත් ප්‍රමාණය කිලෝග්‍රෑම් 39,960,350 ක් වූයෙන් කිලෝග්‍රෑම් 39,650 ක ඌනතාවයන් නිරීක්ෂණය විය. එසේම ඔරුගොඩවත්ත හා මරදාන ගබඩා වෙත ලද සහල් ප්‍රමාණය කිලෝග්‍රෑම් 39,957,650 ක් වූයෙන් වරායෙන් නිදහස් කරගත් ප්‍රමාණය හා ගබඩා වෙත ලැබුණු සහල් ප්‍රමාණය අතර කිලෝග්‍රෑම් 2700 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.ඊට අමතරව අදියර තුනේදීම නැවෙන් ඇමදුම් කරන ලද සහල් කිලෝග්‍රෑම් 42,300 ක් ද නැවත පිරිසිදු කර බෙදාහැරීමේ පදනම මත පැවතිණි.අදියර තුනේදීම නෞභාර පත්‍ර හා

වරායෙන් නිදහස් කර ගත් කිරිපිටි ප්‍රමාණයන් වෙනස් වූ අතර ඌනතාවය කි.ග්‍රෑ.6840 ක් විය.

(ii) අදියර I,II හා III යටතේ දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත බෙදා හරින ලද සහනාධාර හා එම කාර්යාල වෙත ලද සහනාධාර වල සහල් කි.ග්‍රෑ 10910 ක ද, කිරිපිටි කි.ග්‍රෑ 160 ක ද ඌනතාවයක් නිරීක්ෂණය විය.

දිස්ත්‍රික්කය ප්‍රා.ලේ.කාර්යාලය	බෙදාදුන් ප්‍රමාණය (Kg)		ලැබීම් ලෙස තහවුරු කල ප්‍රමාණය (Kg)		හිඟ ප්‍රමාණය (Kg)	
	සහල්	කිරිපිටි	සහල්	කිරිපිටි	සහල්	කිරිපිටි
අදියර I						
නුවරඑළිය	894,000	-	893,700	-	300	-
මන්නාරම	241,400	-	239,250	-	2,150	-
මුලතිව්	251,500	-	251,460	-	40	-
කිලිනොච්චිය	222,500	-	221,900	-	600	-
අම්පාර	494,750	-	494,400	-	350	-
ත්‍රිකුණාමලය	252,000	-	251,650	-	350	-
රත්නපුරය	247,350	-	247,250	-	100	-
බදුල්ල	-	4,950	-	4,886	-	64
කොළඹ ප්‍රා.ලේ	120,000	-	119,960	-	40	-
අදියර II						
මහනුවර		-		-		-
පාතදුම්බර	20,000		18,750		1,250	
ගම්පහ		-		-		-
දිවුලපිටිය	180,000		178,650		1,350	
මීරිගම	90,000	-	89,550	-	450	-
අත්තනගල්ල	135,000	-	134,950	-	50	-
පොළොන්නරුව	443,000	6,000	441,180	5,994	1,820	06
අනුරාධපුර	1,982,500	22,488	1,980,500	22,428	2,000	60
අදියර III						
කොළඹ	20,000	-	19,940	-	60	-
කොළඹ ප්‍රා.ලේ	-	9,000	-	8,970	-	30
එකතුව	5,594,000	42,438	5,583,090	42,278	10,910	160

(ඉ) බෙදා හැරීමේදී තොග අතිරික්තතා ඇති වීම

පහත සඳහන් අවස්ථා වලදී ප්‍රවාහනය කල තොගයට වඩා වැඩි ප්‍රමාණයක් ලද බවට දිස්ත්‍රික් ලේකම් තහවුරු කර තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව නිසි අධික්ෂනය සහ පරීක්ෂාව යටතේ බෙදාහැරීම සිදු කලේද යන්න විගණනයට ගැටලු සහගත විය.

දිස්ත්‍රික්කය ප්‍රා.ලේ.කාර්යාලය	බෙදාදුන් ප්‍රමාණය සහල්(Kg)	ලැබීම් ලෙස තහවුරු කල ප්‍රමාණය සහල් (Kg)	අතිරික්ත ප්‍රමාණය සහල් (Kg)
යාපනය I අදියර	977,250	978,650	1,700
බදුල්ල II අදියර	90,000	91,100	1,100
ගාල්ල බුස්ස II අදියර	45,000	46,350	1,350

(ඊ) බෙදා හැරීමේ ව්‍යදම්

(i) මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහල් මෙට්‍රික් ටොන් 05 ක් හා කිරිපිටි මෙට්‍රික් ටොන් 7.5 ක් ප්‍රවාහනය කර තිබුණ ද ඒ සඳහා ප්‍රවාහන ව්‍යදම ගණනය කිරීමේදී සහල් මෙට්‍රික් ටොන් 20 ක් හා කිරිපිටි මෙට්‍රික් ටොන් 25 ක් බෙදාහැරි බව සඳහන් කර ප්‍රවාහන ව්‍යදම් ගණනය කිරීම නිසා රු.298,024 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) මෙට්‍රික් ටොන් එකක්, කිලෝමීටර් එකක් ප්‍රවාහනය කිරීමට රු.35 ක් අය කිරීමට ප්‍රසම්පාදන තීරණයකට එළඹ තිබුණු අතර කිරිපිටි ප්‍රවාහනයේදී ප්‍රවාහනය කල මෙට්‍රික් ටොන් ප්‍රමාණයට වඩා වැඩියෙන් එනම් ලොරියේ ධාරිතාවයට ගෙවා තිබුණු අවස්ථා විය. පරීක්ෂා කල නියැදියට අනුව වැඩිපුර ගෙවා තිබුණු ප්‍රවාහන ගාස්තුව රු.771,308 ක් විය.

(iii) තෝරාගත් පෞද්ගලික සමාගම බෙදාහැරීම සඳහා ප්‍රවාහන ගාස්තු දැරීමට එකඟ වී තිබියදීත් වෙනත් පෞද්ගලික ප්‍රවාහන සේවා වෙතින් බෙදාහැරීමේ සේවා ලබා ගැනීම නිසා රු.457,494 ක් වැඩිපුර මුදල් ගෙවීමට සිදු වී තිබුණි.

(iv) නිශ්කාශන ව්‍යදම් වලට අදාලව මිල කැඳවීම් අනුව එකඟ වූ ඒකක පිරිවැය ගණනය කිරීමට අදාල වූ ව්‍යදම් අයිතමවලට අමතරව වෙනත් ව්‍යදම් ලෙස අදියර I,II හා III සඳහා රු.1,429,828 ක ව්‍යදමක් ගෙවා තිබුණි. ඒ අනුව ඒ තුල ඇතුලත් වූ රු.540,979 ක වරාය ගාස්තු හා රු.729,532 ක රේගු බදු වලට අමතරව දෙපාර්තමේන්තුව විසින් වරාය ගාස්තු හා රේගු බදු ලෙස පිළිවෙලින් රු.9,495,008 ක් හා රු.9,651,650 ක් ද ගෙවා තිබුණි.

(v) සහනාධාර නිෂ්කාශනය හා බෙදාහැරීම II හා III අදියර සඳහා කිලෝග්‍රෑම් 50 ඒකකයක් සඳහා රු.135.90 ක් අයකර තිබුණු අතර එයින් ප්‍රවාහන ව්‍යදම රු.98.15 ක් විය. සහල් ප්‍රවාහනයේදී කිලෝග්‍රෑම් 50 ඒකකයක් සඳහා 98.15 ක් ප්‍රවාහන ව්‍යදම් ලෙස ගෙවා තිබුණ ද කිරිපිටි ප්‍රවාහනයේදී ලොරි රථයට රු.25,000 බැගින් අදියර දෙක සඳහා රු.1,866,650 ක් වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි. අදියර II යටතේ කිරිපිටි මෙට්‍රික් ටොන් 250 ක් ප්‍රවාහනය සඳහා ලොරි රථ 53 ක්ද, අදියර III යටතේ කිරිපිටි මෙට්‍රික් ටොන් 200 ක් ප්‍රවාහනය සඳහා ලොරි රථ 57 ක්ද භාවිතා කර තිබුණි. මෙට්‍රික් ටොන් 250 ක් සඳහා ලොරි රථ 53 ක් භාවිතා කලේ නම් මෙට්‍රික් ටොන් 200 ක් සඳහා ලොරි රථ ප්‍රමාණය අඩු විය යුතු වුවත් ලොරි රථ 57 ක් භාවිතා කිරීම විගණනයේදී පිලිගත නොහැකි විය. ලොරි රථ මඟින් ප්‍රවාහනය වෙනුවෙන් දරන ලද ව්‍යදම

රු.84,801,727 ක් ලෙස දක්වා තිබුණ ද තවදුරටත් නිරවුල් කල යුතු ප්‍රවාහන වියදම රු.4,407,915 ක් ද එම වියදමට එකතු විය යුතු අතර ඊට අමතරව වෙනත් වියදම් යටතේ දරන ලද රු.3,042,187 ක වියදම ද ඇතුලුව මුළු ප්‍රවාහන වියදම රු.92,251,829 ක් වී තිබුණි.

2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකල යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික වියයුතු වුවත්. වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) මුදල් රෙගුලාසි 138(1)	වවුවර් පත්‍රයක් සහතික කිරීමේදී අදාල ශීර්ෂය, වැඩසටහන, ව්‍යාපෘතිය, ව්‍යාපෘති පංතිය යනාදිය නිවැරදිව අදාල ගිණුමට වැය බරක් වන බවට අදාල නිලධාරියා සහතික විය යුතු වුවද එසේ සහතික කිරීමෙන් තොරව දෙපාර්තමේන්තුවට ඉන්දියානු ආධාර බෙදාදීම සඳහා අතිකාල ලබා දීමට අවකාශ නොතිබියදී ආහාර කොමසාරිස්ගේ (300) වැය ශීර්ෂයේ 1002 වැය විෂයය යටතේ මැයි,ජුනි සහ ජූලි මාස 3 සඳහා රු. 1,041,797 ක් අතිකාල දීමනා සඳහා ගෙවීම් කර තිබුණි
(ආ) මුදල් රෙගුලාසි 371 (2) (ආ)	තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබාදිය හැක්කේ මාණ්ඩලික නිලධාරින්ට පමණක් වුවද රු.895,000 ක් වටිනා අත්තිකාරම් මුදල් මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා නිකුත් කර තිබුණි.

2.6 තැන්පතු

දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු වලට අදාළව රු.110,095,143 ක ශේෂයක් වූ අතර එම ශේෂ තුල වසර 02 ත් 10 ත් අතර රු.54,930,690 ක් හා වසර 10 ට වැඩි රු.25,448,939 ක ශේෂයක් විය. ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

2022 දෙසැම්බර් 31 දිනට සකස් කල බැංකු සැසඳුම් පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2022 දෙසැම්බර් 31 දිනට උපලබ්ධි නොවූ ලැබීම් රු.887,592 ක් පැවති අතර ඒ තුල වසර 07 ඉක්ම වූ රු.55,000 ක ශේෂයක් ද පැවතුණි.

(ii) වර්ෂ දෙකකට අධික හඳුනා නොගත් ලැබීම් රු.36,650 ක් ද ,වසරකට අධික රු.31,775 ක් ද හා මාසයකට අධික රු.1,353,885 ක් ද වශයෙන් මුළු එකතුව රු.1,442,310 ක් වූ හඳුනා නොගත් ලැබීම් පැවති අතර එම ලැබීම් හඳුනා ගැනීමට විගණිත දිනය වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1. සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අදාලව නිකුත් කල මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් විය යුතු වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම අන්තර්ගත කර නොතිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

තොරතුරු තාක්ෂණ ශාඛාව මඟින් මහජනතාවට යාවත්කාලීන තොරතුරු සැපයීම අරමුණු කරගෙන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම ක්‍රියාකාරී සැලැස්ම තුලින් හඳුනාගෙන තිබුණ ද විගණිත දින වන විටත් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

(අ) ආරක්ෂිතව,අබණ්ඩව,පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සෑම නිවසකටම යන දැක්ම යටතේ ක්‍රියාත්මක වන ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්යයන් ලෙස,

(i) දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙ.ටො.8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.

(ii) 2008 අගෝස්තු 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දිවයින පුරා පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො.100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම හඳුනාගෙන තිබුණි.

ඒ අනුව 2022 වර්ෂයේ එම කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් අයවැය ඇස්තමේන්තුවෙන් 300-1-1-3-2506 හා 300-1-1-4-2506 යන වැය විෂයයන් වෙනුවෙන් වෙන් කර තිබූ රු.100,000,000 ක මුළු ප්‍රතිපාදනයම වර්ෂය අවසානය වන විට ද ඉතිරි වී තිබුණි.එසේ පැවතියදී කාර්යසාධන වාර්තාවේ 300-1-1-4-2506 යන වැය විෂයය යටතේ වූ කාර්යසාධන දර්ශකය යටතේ වූ වෙළඳපොල සහල් සුලභතාවය වෙනුවෙන් සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ගේ සහල් නිෂ්පාදනය කිරීමේ වැඩසටහන අධික්ෂණය කිරීම මඟින් වෙළෙඳපොළ තුල සහල් සුලභතාවය පවත්වා ගැනීමට දායක වීම සිදු කර ඇති බවත් එය අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිඵලයක් ලෙස තත්‍ය නිමැවුම් සියයට 75 – 89 අතර පරාසයක දක්වා තිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය යටතේ සියයට සියයක ප්‍රතිශතයක් දක්වා තිබුණි.

(ආ) ආයතනයේ සම්පත් මනා කළමනාකරණය සඳහා අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණ කටයුතු යටතේ ගබඩාවන් සහ නිවාස කුලියට ලබා දීමෙන් රාජ්‍ය ආදායමට දායකත්වය දැක්වීම සියයට 100-90 මට්ටමක බව කාර්ය සාධන වාර්තාවේ හඳුනාගෙන තිබුණ ද 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ගබඩා කුලී රු.95,448,000 ක් හා හිඟ නිවාස කුලී රු.8,763,133 ක් පැවතුණි.

3.1.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

2019 ජූනි 26 සිට 2019 දෙසැම්බර් 26 දක්වා මාස 06 ක කොන්ත්‍රාත් කාලයකට දඹුල්ල උෂ්ණත්ව පාලක ගබඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා ගිවිසුම්ගතව පැවතිය ද කොන්ත්‍රාත්තුව නිම කල යුතු දිනයෙන් වර්ෂ 03 ක් ඉක්මවා තිබියදී ද අදාල ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කර නොතිබුණි. 2022 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම තුල 2022 අප්‍රේල් 30 දින වැඩ අවසන් කිරීමට නියමිත බවත් එය ප්‍රමුඛතා කටයුත්තක් ලෙසත් දක්වා රු.මිලියන 625 ක් ඇස්තමේන්තු කර තිබුණි.2022 වාර්ෂික ඇස්තමේන්තුවේ ඒ වෙනුවෙන් දේශීය අරමුදල්, විදේශ ප්‍රදාන හා විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය වැය විෂයය 2104 යටතේ රු.246,000,000 ක් ඇස්තමේන්තු ගත කර තිබුණ ද දේශීය අරමුදල් සහ විදේශ ප්‍රදාන යටතේ වූ රු.205,400,000 ශුද්ධ ප්‍රතිපාදනය 100% ක් ද විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැයට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් 99% ක් එනම් රු.39,128,224 ක් ද ඉතිරි වී තිබුණි. මෙලෙස පැවතිය දී 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රසම්පාදන ප්‍රගතිය යටතේ සියයට 80 ක ප්‍රගතියක් දක්වා තිබුණි.

3.1.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.2 ඡේදයට අදාලව නිකුත් කර ඇති මාර්ගෝපදේශ අංක 14 අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි 03 වන පරිච්ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කල යුතු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි. තවද 04 පරිච්ඡේදය ප්‍රකාරව ආයතනයේ කාර්යසාධන දර්ශක ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඉදිරිපත් කළ යුතු වුවත් එලෙස සකස් කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) දෙපාර්තමේන්තුව සතුව වාහන 11 ක් පැවතිය ද වාහන 09 ක් පමණක් සිගාස් වත්කම් ලේඛණයේ ඇතුලත් කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතු වාහන 02 ක් වසර 05 කට අධික කාලයක සිට භාවිතයේ නොපැවති අතර එම වාහන සම්බන්ධයෙන් 2020 ඔක්තෝම්බර් 02 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික්ක 15 ක දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම් හා ගොඩනැගිලි 28 ක් තවදුරටත් තක්සේරු කර නොතිබුණි.

3.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

විගණකාධිපති විසින් 2022 වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට 2023 මැයි 29 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණු අතර එම විගණන විමසුම් වල ප්‍රමාද කාලය මාස 01 සිට මාස 03 දක්වා විය.

3.4 කළමනාකරණ දුර්වලතා

(අ) ධාන්‍යාගම නිවාස සංකීර්ණය පිළිබඳ පරීක්ෂාවේදී නිරීක්ෂණයවූ කරුණු පහත පරිදි විය.

(i) නිවාස 366 ක නිවාස සංකීර්ණයක් වශයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් තනවා 1981 නොවැම්බර් 21 දින ආහාර හා සමුපකාර අමාත්‍යාංශය වෙත

නිල වශයෙන් භාර දී තිබූ මෙම ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ ඉඩම විගණිත දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි.

(ii) ඉහත නිවාස 366 න් නිවාස 26 ක් අබලන් තත්ත්වයේ පැවති අතර එම නිවාස වලින් නිවාස 09 ක් අවුරුදු 10 කට අධික කාලයක් තිස්සේ අබලන්ව තිබිය ද අලුත්වැඩියාවන් සිදුකර නොතිබුණි.

(iii) 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂ 5 කට වරක්ම ඉඩම් හා ගොඩනැඟිලි තක්සේරු කල යුතු වුවත් ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ නිවාස අවසන් වරට තක්සේරු කර තිබුණේ 2017 මැයි 15 දිනදීය.

(ආ) දෙපාර්තමේන්තුව සතුව මෙට්‍රික් ටොන් 265,035 ක ධාරිතාවයකින් යුත් ගබඩා 103 ක් පැවති අතර 2022 දෙසැම්බර් 31 දිනට එම ගබඩා හා දෙපාර්තමේන්තුව සතු ගොඩනැඟිලි වලට අදාලව රු.95,448,000 ක හිඟ කුලී පැවතුණි. එයින් රු.42,876,740 ක් දෙපාර්තමේන්තුව දැනට කුලියට ලබා දී තිබුණු බදුකරුවන් 23 දෙනෙකුගෙන් ලැබිය යුතුව පැවතුණු අතර රු.52,571,260 ක් කුලියට ලබා දී නැවත පවරාගෙන තිබූ ගබඩා සම්බන්ධයෙන් විය. තවද බදුකරු කුලී මුදල් ගෙවීම පැහැර හැරීමක් සිදු වූ විට බදු ගිවිසුම අනුව පරිශ්‍රය නැවත පවරා ගැනීමේ හැකියාව බදු දීමනාකරු සතු වුවද දිගින් දිගටම බදු මුදල් ගෙවීම පැහැර හරින ලද ඉහත බදුකරුවන් 23 සම්බන්ධව එලෙස ක්‍රියාකර නොතිබුණි.

(ඇ) ආපනශාලා ගොඩනැඟිල්ල 2019 අගෝස්තු 15 සිට 2022 අගෝස්තු 14 දක්වා පුද්ගලික සමාගමක් වෙත බදු දීම සඳහා පළමු දෙවන හා තෙවන වර්ෂ සඳහා පිළිවෙලින් රු.131,000 , රු.139,400 , රු.156,000 ක මාසික බදු කුලියකට ගිවිසුම්ගතව තිබුණි. ඒ අනුව වසර 3 සඳහා රු.5,116,800 ක කුලී මුදලක් ලැබිය යුතු වුවද, 2020 දෙසැම්බර් 01 සිට 2022 නොවැම්බර් 30 දක්වා පමණක් රු.2,966,000 ක ඉන්වොයිස් නිකුත් කර තිබූ අතර එයින් ද රු.2,443,000 ක් හිඟ කුලී ලෙස පැවතුණු අතර ගිවිසුමේ 28 වන ඡේදය උල්ලංඝණය කිරීම හේතුවෙන් ගිවිසුම අවලංගු කිරීමට ක්‍රියාකර නොතිබුණි. 2022 ඔක්තෝම්බර් 22 දින ආපනශාලාව සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් පොලිසියට පැමිණිල්ලක් සිදුකර ආපනශාලාව මුද්‍රා තබා තිබුණි. මේ වනතුරුත් හිඟ කුලී අයකරගෙන නොතිබූ අතර ආපන ශාලාව වෙනත් පාර්ශවයක් වෙත ලබාදීම සඳහා ප්‍රසම්පාදන කටයුතු හෝ ආරම්භ කර නොපැවතුණි.

(ඈ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2021 යටතේ වූ මාර්ගෝපදේශ 01 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ ලබා දී ඇති ණය මුදල් අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4,4.2.4 හා 4.2.5 වගන්ති ප්‍රකාරව කටයුතු කර තවදුරටත් කල්ගත වූ ණය ශේෂ සම්බන්ධයෙන් මාර්ගෝපදේශයේ (ඉ) ඡේදය ප්‍රකාරව කටයුතු කර තවදුරටත් අයකර ගත නොහැකි ණය ශේෂ පවතී නම් මාර්ගෝපදේශයේ (ඊ) ඡේදය ප්‍රකාරව අදාළ ක්‍රියාමාර්ග ගත් බවට සහතික කළ හැකි ලේඛණ ද සමඟ හිඟ ණය ශේෂ අත්හැරීම සඳහා මුදල් රෙගුලාසි 113 යටතේ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්/භාණ්ඩාගාර ලේකම් වෙත යොමු කිරීම සඳහා වන ඉල්ලීමක් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු වුවද එසේ කිරීමකින් තොරව දෙපාර්තමේන්තුව විසින් මියගිය, විශ්‍රාම ගිය, සේවය අත්හිටවූ සහ සේවය හැරගිය නිළධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ වල එකතුව රු.1,387,731 ක් තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය තුල දක්වා තිබූ අතර ඒ තුල වසර 1-2 අතර රු.346,500 ක ණය ශේෂ ද පැවතිණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) සහ 40(2) වගන්ති ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

බී.ජී.අයි.නිරංජා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට